මුදල් ප්‍රතිපත්ති විවරණය සැකෙවින්

2025 නොවැම්බර්

මහ බැංකුවේ අලුත් ම තීරණය කුමක් ද?

එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය **නොවෙනස් ව** තැබීමට මහ බැංකුව තීරණය කළා **7.75%**

ආර්ථිකයේ වත්මන් තත්ත්වය?



- උද්ධමනය ඔක්තෝබර් මාසයේ දී අඛණ්ඩ ව තෙවන මාසයටත් ඉහළ ගොස් තිබෙනවා.
- ව්‍යාපාරික කටයුතු සහ බැංකු මගින් ලබා දෙන ණය ඉහළ යාමත් සමග ආර්ථිකය යථා තත්ත්වයට පත් වෙමින් පවතිනවා.
- ආනයන ඉහළ ගොස් ඇති නමුත් සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලැබීම් ශක්තිමත් වීම, විදේශීය අංශය ස්ථායී ව පවත්වා ගැනීමට සහාය වී තිබෙනවා.
- දළ නිල සංචිත එ.ජ.ඩොලර් බිලියන 6 ඉක්මවන අතර දෙසැම්බර් මාසයේ දී අමතර විදේශ මුදල් ගලා ඒම් අපේක්ෂා කරනවා.

අනාගතයේ දී ආර්ථිකයට කුමක් සිදු විය හැකි ද?



- 2026 වසරේ දෙවන භාගය වන විට උද්ධමනය ක්‍රමයෙන් ඉහළ ගොස් 5% ඉලක්කගත මට්ටමට ළඟා වනු ඇතැයි අපේක්ෂා කරනවා.
- පුද්ගලයින් සහ ව්‍යාපාර වෙත ලබා දෙන ණය අඛණ්ඩ ව ඉහළ යනු ඇතැයි බලාපොරොත්තු වනවා.
- දේශීය සහ ගෝලීය ආර්ථික ප්‍රවණතා සමීප ව නිරීක්ෂණය කරමින් සහ ආර්ථික වර්ධනයට සහාය වෙමින් උද්ධමනය 5%ක ඉලක්කගත මට්ටමේ පවත්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට මහ බැංකුව සූදානමින් සිටිනවා.

75 YEARS
STABILITY FOR PROSPERITY
1950-2025